ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
இலங்கை காப்புறுதி ஒழுங்குமுறைப்படுத்தல் ஆணைக்குழு
INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01, ශ්‍රී ලංකාව.

11ம் மாடி, கிழக்கு கோபுரம்
உலக வர்த்தக மையம
கொழும்பு 01, இலங்கை.

Level 11, East Tower
World Trade Centre
Colombo 01, Sri Lanka.

+94 11 2396184-9 | +94 11 2396190 | www.ircsl.gov.lk

# මාධ්‍ය නිවේදනය

15.06.2023

## රක්ෂණ ඔප්පු සඳහා වට්ටම් ලබාදීමේ අරමුණින් ගාස්තුවක් අය කරමින් මහජනතාවට වට්ටම් කාඩ්පත් විකිණීම

විවිධ රක්ෂණාවරණ සඳහා වට්ටම් පිරිනමමින් ඇතැම් පුද්ගලයන් විසින් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන උල්ලංඝනය වන පරිදි, ගාස්තුවක් අය කරමින් පාස් කාඩ්පත්/කූපන් කාඩ්පත්/වට්ටම් කාඩ්පත් මහජනතාවට විකිණීමෙහි නිරතව සිටින බවට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අවධානයට ලක් වී ඇත.

එබැවින්, එකී පාස් කාඩ්පත්/කූපන් කාඩ්පත්/වට්ටම් කාඩ්පත් මිලදී ගැනීමෙන් වළකින ලෙස රක්ෂණ නියාමන කොමිෂන් සභාව මහජනතාවගෙන් ඉල්ලා සිටී.

තවද, එවැනි පුද්ගලයන්ගේ තොරතුරු info@ircsl.gov.lk මගින් රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලෙස ද මහජනතාවගෙන් ඉල්ලා සිටී.

රක්ෂණ ඔප්පු මිලදී ගත යුත්තේ ලියාපදිංචි රක්ෂණ සමාගම් වලින් හෝ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගම් වලින් හෝ රක්ෂණ සමාගම්වල සහ/හෝ රක්ෂණ තැරැව්කාර සමාගම්වල බලයලත් රක්ෂණ නියෝජිතයන් හරහා **පමණක්** බවට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මෙයින් අවධාරණය කරයි.

ලියාපදිංචි රක්ෂණ සමාගම් සහ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගම් ලැයිස්තුව රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි වෙබ් අඩවියෙන් ලබාගත හැක: www.ircsl.gov.lk